රුහුණ විශ්වවිද්‍යාලය

**2020/2021** අධ්‍යයන වර්ෂය

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

පළමු සමාසික අවසන් පරීක්ෂණය - **2021** නොවැම්බර්

MAE 5100 සූක්ෂම ආර්ථික න්‍යාය

UNIVERSITY OF RUHUNA
06 JUL 2023
LIBRARY - MATARA

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් **(02)** සමන්විතවන අතර එක් කොටසකින් <u>ප්‍රශ්න දෙක **(02)**</u> බැගින් තෝරා ගෙන <u>ප්‍රශ්න හතරකට **(04)** කට පමණක්</u> පිළිතුරු සපයන්න.

ගණක යන්ත්‍ර භාවිතයට අවසර ඇත. කාලය: පැය 03 යි

---

<u>අ කොටස</u>

1)

a) පහත දැක්වෙන්නේ ආයතනයක මුළු පිරිවැය ශ්‍රිතයයි.

$$TC = 5Q^3 - 60Q^2 + 300Q$$

I. ආන්තික පිරිවැය ශ්‍රිතය සොයන්න.

(ලකුණු 01)

II. සාමාන්‍ය පිරිවැය ශ්‍රිතය සොයන්න.

(ලකුණු 01)

III. ආන්තික පිරිවැය හා සාමාන්‍ය පිරිවැය වක්‍රවල අවම ලක්ෂයන්සොයන්න.

(ලකුණු 02)

IV. අවම සාමාන්‍ය පිරිවැයේදී ආන්තික පිරිවැය හා සාමාන්‍ය පිරිවැය සමානවන බව පෙන්වන්න.

(ලකුණු 03)

b) Q නිමවුම් ප්‍රමාණය සඳහා වූ නිෂ්පාදන ශ්‍රිතය, ප්‍රාග්ධනය K හා ශ්‍රමය L ලෙස පහත දැක්වේ.

$$Q = 1200L^2K^2 - L^3K^3$$

I. ප්‍රාග්ධනයේ හා ශ්‍රමයේ ආන්තික හා සාමාන්‍ය ඵලදා ශ්‍රිත ගොඩනගන්න.

(ලකුණු 04)

II. ප්‍රාග්ධනය ඒකක 10 ක් ලෙස උපකල්පනය කොට ශ්‍රමයේ ආන්තික හා සාමාන්‍ය ඵලදාව ගණනය කරන්න.

(ලකුණු 02)

III. K=10 අවස්ථාවේ උපරිම නිෂ්පාදන ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 02)

2)

a)

I. වෙළෙඳ පොළ ආර්ථික පද්ධතියක දක්නට ලැබෙන ලක්ෂණ මොනවාද ? ඒවා වර්තමානයේ ශ්‍රී ලංකා ආර්ථිකය තුල කුමන ආකාරයකින් ක්‍රියාත්මකවේදැයි විස්තර කරන්න.

(ලකුණු 02)

b) පහත දැක්වෙන්නේ කල්පිත වෙළෙඳ පොළක දත්ත වේ.

| මිළ | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය |
|---|---|---|
| 23 | 216 | 76 |
| 32 | 144 | 184 |

I. ඉල්ලුම් හා සැපයුම් සමීකරණ (රේඛිය යැයි උපකල්පනය කරමින්) ඇස්තමේන්තු කරන්න.

(ලකුණු 02)

II. සමතුලිත මිළ හා ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 01)

III. සමතුලිතයේදී ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාවයන් ගණනය කරන්න.

(ලකුණු 02)

IV. මෙම භාණ්ඩය මත රුපියල් 10.00 ක් වූ ඒකක බද්දක් පැනවුයේ නම්, නව සමතුලිත මිළ හා ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 02)

V. මෙම බද්දෙන් කවර ප්‍රතිශතයක් නිෂ්පාදකයා විසින් දරනු ලබයිද ?

(ලකුණු 01)

VI. මෙම බද්ද නිසා ආර්ථිකයට අහිමිවන සුභසාධනය ගණනය කරන්න.

(ලකුණු 02)


VII. මෙම භාණ්ඩය මත බද්දක් නොව, රුපියල් 5.00 සහනාධාරයක් පැනවුයේ නම්, නව සමතුලිත මිළ හා ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 02)

VIII. මෙම සහනාධාරය නිසා ආර්ථිකයට අහිමිවන සුභසාධනය ගණනය කරන්න.

(ලකුණු 01)

3) පහත දක්වා ඇති රූප සටහන මගින් ඒකාධිකාරී වෙළෙඳපොළක් පෙන්වයි.එහි දැක්වෙන තොරතුරු භාවිතා කර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




I. ඒකාධිකාරී ආයතනයේ එකම අරමුණ ලාභය උපරිම කිරීම නම් ඒ සඳහා නිෂ්පාදනය කිරීමට අවශ්‍ය පරිමාණය, විකුණුම් මිල සහ මුළු ලාභය ගණනය කරන්න.

(ලකුණු 06)

II. එසේ නිෂ්පාදනය කරන අවසාන ඒකකය දක්වා ඒකාධිකාරියා විසින් පළමු මාත්‍රයේ මිල විශේෂණය කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට තීරණය කරන්නේ නම්, ඔහුට මිල විශේෂණය කිරීමෙන් ලබා ගත හැකි අමතර ලාභය කොපමණ ද?

(ලකුණු 04)

III. ඒකාධිකාරී ලාභය මත 20%ක සමාගම් බද්දක් පනවා ඇතැයි උපකල්පනය කරන්න. එවිට ලාභය උපරිම කරන නිමවුම් මට්ටම කෙසේ වෙනස් වේ ද?

(ලකුණු 03)

IV. මෙම නිෂ්පාදනය පූර්ණ තරගකාරී වෙළෙඳපොළක අලෙවි කළේ නම් අලෙවි ප්‍රමාණය සහ විකුණුම් මිල කොපමණ වේද ?

(ලකුණු 02)

<u>ආ කොටස</u>

4)

I. පහත සඳහන් ව්‍යාපාරික ආයතන ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත වීමට වැඩි ඉඩක් ඇතැයි සිතිය හැකි වෙළෙඳපොළ ව්‍යුහය අනුව වර්ග කරන්න.

a. වාහන සේවා සැපයුම් ස්ථාන
b. අවමංගල්‍ය සේවා සැපයුම්කරුවන්
c. රූපලාවණ්‍යාගාර
d. වී වගාව
e. සහල් සැකසීම
f. සිමෙන්ති බ්ලොග් ගල් නිෂ්පාදනය
g. අලුත් මාළු විකිණීම
h. විදුලි සැපයුම
i. LP ගෑස් සැපයුම
j. පාසල් පාවහන් නිෂ්පාදනය
k. කුඩ නිෂ්පාදනය
l. බිත්තර නිෂ්පාදනය

(ලකුණු 04)

II. ‘පෙයාර්ස්’ සහ ‘ෂෙරමි’ යනු ළදරු සබන්, මෘදු කාරක ක්‍රීම් සහ කොලෝන් සඳහා ජනප්‍රිය වූ වෙළෙඳ නාම දෙකකි. ඔවුන් අයත්වන වෙළෙඳපොළ ව්‍යුහය ඔබ නම් කරන්නේ කවර නමකින් ද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කිරීමට අවම වශයෙන් හේතු තුනක් දක්වන්න.

(ලකුණු 03)

III. ඔබට රූපවාහිනිය තුළ සිසිල් බීම පිළිබඳ ප්‍රචාරක දැන්වීම් විශාල ප්‍රමාණයක් දැකිය හැකිය. එහෙත් වතුර බෝතල් සඳහා සැකසුන එක් දැන්වීමක් වත් ඔබට නොපෙනෙන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 04)

IV. බොහෝ ත්‍රිරෝද රථ හිමියන්ගේ ලීසින් වාරික ගෙවාගනු නොහැකිව දැනටමත් කල් ඉකුත් වී ඇතත් ඔවුහු මගී ප්‍රවාහන සේවය දිගටම කරගෙන යති. වෙළෙඳපොළ ව්‍යුහයන්, විචල්‍යය සහ ස්ථාවර පිරිවැය, සාමාන්‍ය ලාභය, වසා දැමීමේ ලක්ෂය යනාදිය පිළිබඳ ඔබේ දැනුම භාවිතා කරමින් මෙම තත්වය සඳහා ආර්ථික විද්‍යාත්මකව පිළිගත හැකි පැහැදිලි කිරීමක් කරන්න.

(ලකුණු 04)

5)

I. “භාණ්ඩයක මිල වැඩි වන විට සියලුම භාණ්ඩ සම්බන්දව ආදායමේ මිලදී ගැනීමේ ශක්තිය අඩු වීමකුත් භාණ්ඩයක මිල අඩු වන විට සියලුම භාණ්ඩ සම්බන්දව ආදායමේ මිලදී ගැනීමේ ශක්තිය වැඩි වීමකුත් සිදුවේ”.
මෙම ප්‍රකාශයේ සත්‍යතාවය උපේක්ෂා වක්‍ර විග්‍රහය භාවිතා කරමින් පරීක්ෂා කරන්න.

(ලකුණු 12)

II. ඔබේ ආදායම අත්‍යවශ්‍ය සහ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩවලින් ප්‍රශස්ත ප්‍රමාණයන් මිලදී ගැනීමට වෙන් කිරීමට ඔබට අවශ්‍ය බව සිතන්න.

i. කොබ්-ඩග්ලස් (Cobb-Douglas) උපයෝගීතා ශ්‍රිතයක් උපකල්පනය කරමින් ඔබගේ ගැටලුව ගණිතමය වශයෙන් පෙන්වන්න.

(ලකුණු 02)

ii. භාණ්ඩ දෙකෙහිම ප්‍රශස්ත ප්‍රමාණයන් තීරණය කරන මාෂලියන් ඉල්ලුම ශ්‍රිත (Marshallian demand functions) දක්වන්න. (ශ්‍රිත ලබගත් ආකාරය දැක්වීම අවශ්‍ය නොවේ.)

(ලකුණු 01)

6)

I. ඔබේම උදාහරණයක් භාවිතා කරමින් වෙළඳපළ ප්‍රමාණය තීරණය කිරීම පිළිබඳව ස්ටැකල්බර්ග් නායකත්ව ආකෘතියට (Stackelberg's leadership model) අනුව ප්‍රථමයෙන් තම වෙළඳපළ ප්‍රමාණය නිවේදනය කිරීමට නායක සමාගම ගන්නා වූ තීරණයක් උපායමාර්ගික වාසියක් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

II. වර්තමාන රජය මෙරට ගොවීන් සඳහා කාබනික පොහොර ප්‍රතිපත්තියක් හඳුන්වා දුන්නේය. කෙසේ වෙතත්, ගොවීන් මෙම ප්‍රතිපත්තියට විරුද්ධ වූයේ දිගු කාලයක් තිස්සේ රසායනික පොහොර භාවිතා කළ, තම දැනට පවතින කෘෂිකාර්මික ඉඩම්වලට සෘජුවම මෙම කාබනික පොහොර භාවිතා කළ නොහැකි බැවින්, අස්වැන්න අඩු කර ගත නොහැකි බව පවසමිනි.

රජය විසින් ඉදිරිපත් කරන ලද කාබනික පොහොර ප්‍රතිපත්තියට ගොවීන් සහ රජය ප්‍රතිචාර දක්වන ආකාරය අවබෝධ කරගනිමින් ක්‍රීඩා-න්‍යායාත්මක ප්‍රවේශයක් ඇසුරින් සුදුසු විසඳුමක් සෙවීමට යෝජනා ඉදිරිපත් කරන්න.

(ලකුණු 10)

@@@@@@@@@@@@